# සංක්ෂිප්තය

ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනය පුළුල් කිරීම සඳහා පාසල් තීරණ ක්‍රියාවලියට ප්‍රජා සහභාගිත්වය ලබා ගැනීමේ අරමුණින් 2008. 09.15 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 2008/35 මගින් සහ 2013.11.28 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 07/2013 මගින් ලබාදෙන ලද උපදෙස් අනුව තීරණ ගනු ලබන සභාවක් ලෙස පාසල් සංවර්ධන කමිටුව ස්ථාපනය කරන ලදී. මෙම පාසල් සංවර්ධන කමිටුව, පාසල් සංවර්ධන සමිති චක්‍රලේඛය ට අනුව පාසලේ ක්‍රියාත්මක වූ කළමනාකාර කමිටුවෙන් සංයුතියෙන් හා කාර්යභාරයෙන් වෙනස් වේ.

මෙම අධ්‍යයනයේ අරමුණු වන්නේ පාසල් නගාසිටුවීමේ වැඩසටහන පිළිබඳ පාසල් ප්‍රජාව දැනුවත් කිරීම සඳහා යොදා ගන්නා ලද වැඩපිළිවෙල පිළිබඳ විමසා බැලීම, පාසල් නගාසිටුවීමේ වැඩසටහන තුළ සහභාගිත්ව කළමනාකරණය ක්‍රියාත්මක වන ආකාරය විමසා බැලීම, සහභාගිත්ව කළමනාකරණය ක්‍රියාත්මක කිරීමේ දී ඇති වූ අභියෝග හා ගැටලු විමසා බැලීම, එසේ ඇති වූ අභියෝග සඳහා යෙදූ විකල්ප විසඳුම් විමසා බැලීම, සහභාගිත්ව කළමනාකරණය පාසල් නගාසිටුවීමේ වැඩසටහන තුළ සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කළයුතු උපාය මාර්ග සඳහා නිර්දේශ හා යෝජනා විමසා බැලීම වේ.

පර්යේෂණය සඳහා කොළඹ, මිනුවන්ගොඩ සහ කැළණිය යන අධ්‍යාපන කලාපයන්හි පාසල් 10 ක් ස්ථරායන නියැදීම් ක්‍රමය යොදා ගනිමින් නියැදිය සඳහා තෝරාගත් අතර එම පාසල්වල විදුහල්පතිවරුන් 10 ක්ද, නියෝජ්‍ය විදුහල්පතිවරුන් 10 ක්ද, ගුරුවරුවරුන් 60 ක්ද, දෙමාපියන් 70 ක්ද, ආදි ශිෂ්‍යයින් 40 ක්ද, කලාප නිලධාරීන් 7ක් ද, පළාත් නිලධාරීන් එක් අයෙකු ද, සහ අධ්‍යාපන අමාත්‍යාංශ නිලධාරීන් දෙදෙනෙකු ද වශයෙන් වූ නියැදි ඒකක 210 ක් යොදා ගැනින. දත්ත එකතු කිරීමේ මිනුම් උපකරණ ලෙස ප්‍රශ්නාවලී, සම්මුඛ සාකච්ඡා, දුරකථන සාකච්ඡා භාවිතා කරන ලදී.

පාසල් නගාසිටුවීමේ වැඩසටහන තුළ සහභාගිත්ව කළමනාකරණය ක්‍රියාත්මක කිරීමේ දී ඇති වූ අභියෝග හා ගැටලු ලෙස සහභාගිත්ව දර්ශනයක් නොමැති වීම, පුහුණුවක් නොමැති වීම, විදුහල්පතිගේ ආධිපත්‍ය, අධ්‍යාපනික ප්‍රශ්න පිළිබඳ අවධානය අඩු වීම, තම අදහස් රැස්වීමේදී ප්‍රකාශ කිරීමට මැලි වීම, කමිටු රැස්වීම් සඳහා සහභාගීත්වය සහ උනන්දුව අඩු මට්ටමක පැවතීම, කමිටු රැස්වීම්වල දී තනි පුද්ගලයින්/කණ්ඩායම් පෞද්ගලික අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කිරීම, මතභේදාත්මක කරුණු සාකච්ඡා කෙරෙන විට තම අදහස් ප්‍රකාශ කිරීමේ දී අමනාපකම් ඇතිවීම, විවිධ කරුණු සම්බන්ධව දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ ද අවසන් තීරණයකට නොඑළඹීම, වෙනසක් ඇති කිරීමට අවශ්‍ය භෞතික, මානව, මූල්‍ය සම්පත් වල හිඟය, බලාත්මක චක්‍රලේඛයක් පැවතිය දී ඊට පරස්පර උපදෙස් සහිත චක්‍රලේඛ නිකුත් කිරීම, පාසල් පරිපාලනයට හා මූල්‍ය කළමනාකරණයට අදාළ චක්‍රලේඛ කිහිපයක් පැවතීම, දැනුවත් නිලධාරීන් නොමැතිකම, කලාප නිලධාරීන්ගේ හිඟය, කලාප නිලධාරීන් පාසල් කමිටු රැස්වීම්වලට නොයාම, දුෂ්කර ග්‍රාමීය පාසල්වල පාසල් ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය බව අනාවරණය වේ.

සහභාගිත්ව කළමනාකරණය පාසල් නගාසිටුවීමේ වැඩසටහන තුළ සාර්ථකව ඉටුකර ගැනීම සඳහා ශිෂ්‍ය ඉගෙනුම් අපේක්ෂා ඉහල නංවන්නා වූ දැක්මක් පාසලට ඇති කිරීම, පාසල් ප්‍රමුඛතා වලට අදාල තොරතුරු සන්නිවේදනය සහ රැස් කිරීම සඳහා යාන්ත්‍රණයක් බිහි කිරීම, පාසල් නගාසිටුවීමේ වැඩසටහනෙහි තීරණ ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්පාදනය සහ ඊට කම්වූ සාමාජිකයින් සහභාගි කරවීම, පාසල් නගාසිටුවීමේ වැඩසටහන අධීක්ෂණය හා මගපෙන්වීම, තීරණ ගැනීමේ ක්‍රියාවලිය හා සම්බන්ධ වන විෂයයන් (විෂය මාලාව, අයවැය, පිරිස් පාලනය) මත ක්‍රියා කිරීමට ප්‍රමාණවත් බලයක් පාසලට ලබා දීම, පාසල් පාදක ගුරු සංවර්ධනය තුලින් වෘත්තීය ඉගෙනුම් ප්‍රජාවක් සහ හුවමාරු දැනුම් පදනමක් බිහි කිරීම, පාසල් පරිපාලනය හා මූල්‍ය කළමනාකරණයට අදාළ එක් චක්‍රලේඛයක් පමණක් තිබීම, පාසැලට පිටතින් සම්පත් ලබා ගැනීම සිදුකළ යුතුව ඇතැයි අනාවරණය විය.

ABSTRCT

The School Development Committee was established as a Council that takes its decisions in accordance with the instructions provided by the Ministry of Education Circular No. 07/2013 dated 28.11.2013 and the Ministry of Education Circular No. 2008/35 dated 15.09.2008, with the purpose of obtaining participation of the community in school decision making process, in order to broaden the qualitative development of Education. This School Development Committee differs in constitution and function from the Management Committee implemented in the school as per the School Development Societies Circular.

This Study aims at inquiring about the course of action implemented in raising awareness of the School Community regarding the Program for School Improvment, inquiring in to the manner in which participatory management is implemented within the Program for School Improvment, inquiring about the challenges and issues faced during the implementation of participatory management, inquiring about the alternative solutions that were implemented to overcome the challenges thus arose and inquiring about recommendations and proposals for strategies to be followed in order to successfully implement participatory management within the Program for School Improvment.

10 Schools from the Educational Zones of Colombo, Minuwangoda and Kelaniya were selected as the sample for the experiment using the Stratified Random Sampling Technique and Questionnaires, Interviews and Telephone Conversations were used as measuring equipment to collect data from the 210 units of samples that included 10 Principals, 10 Deputy Principals, 60 Teachers, 70 Parents, 40 Past pupils 07 Zonal Officers, one Provincial officer and Two Officers from the Ministry.

Absence of a Participatory philosophy, lack of proper training, dominance of the Principal, lack of attention on educational issues, backwardness in expressing own ideas at meetings, low levels of participation and stimulus in meetings, Individuals/groups attempting to realize personnel goals in committee meetings, disputes arising in situations where personnel opinions are expressed during discussions of controversial points, inability to reach a final decision on various matters even after lengthy discussions, lack of physical, human and financial resources needed to generate a change, issuance of circulars with

contradictory instructions to the circular already in effect, existence of several circulars regarding school administration and financial management, dearth of Officers with awareness, deficiency of Zonal Officers, absence of Zonal officers in school committee meetings and the Socio Economic status of the School community of the rural schools in difficult areas, are discovered to be among the challenges and issues faced during the implementation of Participatory Management within the Program for School Improvment.

It was further discovered that in order to successfully implement participatory management within the Program for School Improvment, methods such as generating a vision for the school that enhances the learning objectives of students, generation of a methodology to communicate and collect information with regard to school priorities, preparation of programs that raise awareness on the decision making process of the Program for School Improvment and ensuring committee members' participation in them, monitoring and providing guidance to the Program for School Improvment, providing the school with sufficient authority to act on topics that connect with the decision making process (curriculum, budget, staffing), ensuring the existence of a single circular pertaining to school administration and financial management, generation of a professional learning community and an exchange knowledge base and obtaining external resources for the school, needed to be implemented.